## Abstract 04

# ත්‍රිපිටකයේ සැඟවුණු ධ්වනිතාර්ථ

**පූජ්‍ය. චික්කෝ චක්මා හිමි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර - පාලි),
*srimanju827@gmail.com*

ධ්වනි සංකල්පය ක්‍රි. ව. 9 සියවස දී **ආනන්දවර්ධන** පඬිතුමා විසින් හඳුන්වා දෙන ලද්දකි. කිසියම් ප්‍රකාශයකින් හෝ පදයකින් **යෝජිත අර්ථය (suggested meaning)** ඔහු විසින් **ධ්වනිය** හෙවත් **ව්‍යංගාර්ථය** ලෙස හඳුන්වන ලදී. එය භාෂාවෙහි **ව්‍යඤ්ජනා ශක්තිය** ලෙස ද හැඳින්වේ. **භරත** මුනිවරයාගෙන් (ක්‍රි. ව. 01 සියවස) ආරම්භ වන සංස්කෘත කාව්‍ය විචාර ඉතිහාසයෙහි අද්විතීය සොයා ගැනීම වන මෙය විශිෂ්ට කාව්‍ය නිර්මාණයක් බිහි කිරීමට භාවිත කළ හැකි ශිල්පීය ක්‍රමවේදයක් වේ. මෙම සංකල්පය දෙස බෞද්ධ පසුබිමෙහි පිහිටා බලන විට වැදගත් ම කරුණ වන්නේ **ආනන්දවර්ධනයන්ට** මෙම සංකල්පය ගොඩනගා ගැනීමට තථාගත දේශනා උපයෝගී වූ බව පෙනීයාම යි. භාෂාව පිළිබඳ භාවිතයේ දී සංස්කෘත විචාරකයන්ට වඩා පුළුල් දැක්මක් බුදුරදුන්ට විය. විශේෂයෙන් ත්‍රිපිටකයෙහි කිහිප තැනක හමුවන "**සාත්ථං සබ්‍යඤ්ජනං**" යන ප්‍රයෝගය මෙහි දී වැදගත් වේ. ධර්මය සන්නිවේදනය කිරීම සඳහා ප්‍රථම භික්ෂූන් හැට නමට බුදුරදුන් උපදෙස් දී ඇත්තේ "**සාර්ථ හා සව්‍යඤ්ජන**" භාෂාව භාවිත කිරීමට ය. එයින් අදහස් වන්නේ අර්ථයට මූලිකත්වයක් දිය යුතු බව හා තමන් විසින් ප්‍රකාශ කරනු ලබන දෙයට අර්ථ ගම්භීරත්වයක් සහ අර්ථ පෘථුලත්වයක් ද චිත්තග්‍රාහී බවක් ද ප්‍රවේශ කළ යුතු බව යි. බුදුදහමෙහි **නෙයාත්ථ දෙසනා** යන්නෙහි ද මෙකී ධ්වනිගත අර්ථය ප්‍රකාශ වේ. එය බුදුදහම යොදා ගනු ලබනුයේ ගැඹුරු සිද්ධාන්ත විවරණය කිරීමට ය. බුදුරදුන් කාව්‍ය ශාස්ත්‍රයට පමණක් නොව දාර්ශනික සිද්ධාන්ත විවරණයේ දී ද ධ්වනි භාෂාව උපයෝගී කර ගත් අයුරු ත්‍රිපිටක භාෂාවෙහි මැනවින් විද්‍යමාන වේ. පාලි සූත්‍රාන්ත දේශනාවල සාහිත්‍යමය, කාව්‍යමය, දාර්ශනික, විද්‍යාත්මක සහ මනෝ විද්‍යාත්මක ආදී විවිධ පැතිකඩ හැදෑරිය හැකිව ඇත්තේ මේ නිසා ය. මෙම පර්යේෂණයේ මූලික අභිප්‍රාය වන්නේ තථාගත දේශනාවෙහි ධ්වනි ලක්ෂණ හඳුනා ගැනීම සහ එහි සාහිත්‍යමය හා දාර්ශනික උපයෝගීතාව විවරණය කිරීමත් ය.

**ප්‍රමුඛ පද :** ත්‍රිපිටකය, ධ්වනි, නෙයාත්ථ දෙසනා, ව්‍යංගාර්ථ, සබ්‍යඤ්ජන